**කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව**
**නීති පීඨය**
**නීතිවේදී උපාධි පරීක්ෂණය - සිව්වන වසර - 2017**

**බදු නීතිය**
(පැ 03යි)

සම්පූර්ණ ප්‍රශ්ණ සංඛ්‍යාව: 07

ප්‍රශ්ණ **හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

1. නයන්ති, 'සඳරුවන්' පුවත්පතට අනුයුක්තව මාධ්‍යවේදිනියක වශයෙන් සේවය කරයි. ඇයගේ මාසික වැටුප රුපියල් 45,000/- කි. ඊට අමතරව, ඇය වෙනත් පුවත්පතකට සතිපතා ලිපි සපයමින් ස්වාධීන මාධ්‍යවේදිනියක වශයෙන් කටයුතු කරන අතර, ඒ සඳහා ඇය වෙත එක් ලිපියක් සඳහා රුපියල් 2,000/- බැගින් ගෙවීම් සිදුකරයි. ඇය අතිරේක ආදායමක් ලබා ගැනීම සඳහා ජනමාධ්‍යකරණය හදාරන ශිෂ්‍යයින් සඳහා පුද්ගලික උපකාරක පන්ති පවත්වන අතර එමගින් දළ වශයෙන් රුපියල් 80,000/-ක පමණ මාසික ආදායමක් උපයයි. මෑතකදී නයන්ති මාධ්‍යකරණය පිළිබඳව අන්තර්ජාතික සම්මානයක් දිනාගත් අතර එම සම්මානය ලබා ගැනීම සඳහා තායිලන්තය වෙත යාමට ගුවන් ටිකට්පත හා නවාතැන් පහසුකම් වෙනුවෙන් රුපියල් 90,000/-ක මුදලක් සඳරුවන් පුවත්පත විසින් ලබා දෙන ලදී.

සේවානියුක්තියෙන් උපයන ආදායම් ආශ්‍රිත අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු නීතිය ඇසුරින් නයන්තිගේ ආදායම් බදු වගකීම සාකච්ඡා කරන්න.

2. ප්‍රාග්ධන ලාභ සහ ආදායම් ස්වභාවයේ ලාභ (Revenue) සතු අනන්‍ය ලක්ෂණ සන්සන්දනය සහ ප්‍රතිසන්දනය කරමින්, සුදුසු නිදසුන් සහිතව, ප්‍රාග්ධන ලාභ සහ ආදායම් ස්වභාවයේ ලාභ අතර වෙනස පැහැදිලි කරන්න.

3. දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන ආශ්‍රයෙන් බදු ගෙවන්නාට අවාසිදායක වන අන්දමින් තක්සේරුකරු සතු බලතල යොදා ගත හැක්කේ කෙසේදැයි සහ තක්සේරුකරණ යාන්ත්‍රණය වඩාත් සමබර කිරීම සඳහා ඔබ විසින් යෝජනා කරන සංශෝධන කිසිවක් තිබේනම් ඒ කවරේදැයි යන්න පිළිබඳව අදහස් දක්වන්න.

4. "මෙට්කො ලිමිටඩ්" යනු පුද්ගලික සමාගමකි. 2016/2017 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් වියදම් සිදු කර ඇත.

(අ) ලියාපදිංචි ගාස්තු සහ උපදේශක ගාස්තු ඇතුළත්ව, සමාගමේ වෙළඳ ලාංඡනය ලියාපදිංචි කිරීම සඳහා නෛතික වියදම් රුපියල් 750,000/- කි.

(ආ) බැංකුවේ තැන්පත් කිරීම සඳහා සමාගම සතු වාහනයෙන් ප්‍රවාහනය කරමින් තිබියදී තුවක්කු පෙන්වා කොල්ලකන ලද මුදල රුපියල් 800,000/-කි.

(ඇ) සේවකයින් වෙනුවෙන් පවත්වන ලද නායකත්ව කුසලතා පිළිබඳ වැඩමුළුව වෙනුවෙන් වැය කළ මුදල රුපියල් 600,000/-කි.

සමාගම එහි දළ ලාභයෙන් මෙම වියදම් අඩු කර එහි තක්සේරු කළ හැකි ආදායම නිශ්චය කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා ඔබ සමාගම වෙත උපදෙස් ලබා දෙන්නේ කෙසේද?

5. අභියාචනාධිකරණය වෙත නඩුවක් ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු අනිවාර්ය අවශ්‍යතා කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, අභියාචනාධිකරණය වෙත කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අදාළ වන 2011 අංක 23 දරන බදු අභියාචන කොමිෂන් සභා පනතේ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනයන් විවේචනාත්මකව විග්‍රහ කරන්න. අදාළ නඩු තීන්දු නීතිය ඇසුරින් ඔබේ පිළිතුර තහවුරු කළ යුතුයි.

6. " රජයේ බදු ආදායම ශක්තිමත් කිරීම සඳහා පැහැර හරින ලද බදු අය කර ගැනීමට ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයා සතුව අතිවිශාල බලතල තිබීම අවශ්‍ය වන නමුත් එමගින් බදු ගෙවන්නා විෂයෙහි යම් අහිතකර බලපෑම් ඇති කරයි."

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ පවත්නා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ විනිශ්චිත තීන්දු ඇසුරින් ඉහත ප්‍රකාශයේ වලංගුතාව විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

7. දේපළ සංවර්ධනය කරන්නෙකු වන වජිර වෙත පැමිණි ඔහුගේ මිතුරෙකු වන ආනන්ද, කොළඹ 05 ප්‍රදේශයේ පිහිටි පර්චස් 50ක බිම් කොටසක බද්ධ නිවාස සංකීර්ණයක් ඉදිකරන ලෙස ඉල්ලා සිටියේය. වජිර, අවශ්‍ය සියළු කටයුතු සූදානම් කොට එම ඉඩමෙහි බද්ධ නිවාස සමූහයක් ඉදි කළේය. වජිර සහ ආනන්ද යන දෙදෙනාටම එම ගොඩනැගිල්ලෙන් බද්ධ නිවාස ලැබුණි. පසුව, ආනන්දගේ දියණිය ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී, ආනන්ද, වජිරගේ බද්ධ නිවාසය ඇය වෙනුවෙන් මිලට ගත්තේය. බද්ධ නිවාසය පිහිටියේ අධික ලෙස දූෂිත ප්‍රදේශයක බව අවබෝධ කරගත් වජිර, එය විකිණීමට උනන්දු වූ අතර විකිණීමෙන් රුපියල් 1,000,000/-ක ලාභයක් උපයා එම මුදලින් කොළඹින් වඩාත් ඈත පිහිටි වෙනත් බද්ධ නිවසක් මිලට ගත්තේය. ඔහු පදිංචි ඔහුගේම නිවසක් තිබූ බැවින් මෙම බද්ධ නිවස ඔහු කුලියට දුන්නේය. මෙම ලාභ වජිර විසින් වෙළඳාමෙන් උපයන ලද ආදායම් වශයෙන් සලකා තක්සේරුව ලක් කර ඇත. එම තක්සේරුව අභියෝගයට ලක් කිරීමට ඔහු අපේක්ෂා කරයි. ඔහු වෙත උපදෙස් දෙන්න.

**********************************************